# සමකාලීන රොඩී කුලිකයන්ගේ සමාජ වෙනස්වීම හා සමාජ මූලප්‍රවාහකරණය පිළිබඳ සමාජ-මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

**බමුණු ආරච්චි එල්.කේ[1], කෝණාර මුදියන්සේලාගේ අයි.එස්.කේ[2]**

සමකාලීන රොඩී කුලිකයාගේ සමාජ වෙනස්වීම හා සමාජ මූලප්‍රවාහය වෙත යළි මුහුවීම (Inclusion)සඳහා ඔහු අනුගමනය කරන අනුවර්තන උපක්‍රම ප්‍රපඤ්චවේදීමය සහ මානව ක්‍රම විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් ඔස්සේ සමාජ-මානව විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම මෙකී පර්යේෂණයේ මූලික අරමුණයි. මහනුවර මැණික්හින්න ප්‍රදේශයේ පිහිටා ඇති කුරගන්දෙණිය ගම්මානය හා මාවනැල්ල ප්‍රදේශයේ පිහිටා ඇති තලපිටියගම ගම්මානය පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගනු ලැබිණි. දත්ත දායකයන් තෝරා ගැනීම අරමුණු සහගතව සිදු කරනු ලැබූ අතර දත්ත සන්තෘප්ත අවස්ථාව (Data Saturation Point) මත පිහිටා දත්ත දායකයන් 30 දෙනෙකු ඇසුරෙන් තොරතුරු ලබා ගැනුණි. දත්ත ලබා ගැනීම සඳහා අවිධිමත් සංවාද, ගැඹුරු සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන සහ සහභාගී නොවන නිරීක්ෂණ යන ශිල්ප ක්‍රම භාවිත කරනු ලැබිණි. දත්ත විශ්ලේෂණය තේමාත්මක විශ්ලේෂණයක් ඔස්සේ සිදු කෙරිණි. සමකාලීන රොඩී කුලිකයන් සමාජ මූලප්‍රවාහය වෙත යළි එකතු වීම සඳහා අනුගමනය කර ඇති අනුවර්තන උපක්‍රම මූලික අනු තේමාවන් හයක් ඔස්සේ පෙළගැස්වීමට හැකියාව ලැබිණි. ඒ ඔස්සේ සමකාලීන රොඩී කුලිකයාගේ සමාජීය, ආර්ථික, දේශපාලනික, අධ්‍යාපනික, සංස්කෘතික හා ආගමික අනුවර්තන උපක්‍රම පිළිවෙළින් සාකච්ඡාවට බඳුන් කරන ලදී. සමාජීය අනුවර්තන උපක්‍රම යටතේ සමකාලීන රොඩී කුලිකයන් තම පාරම්පරික වාසගම් වෙනස් කොට ගොවිගම හෝ ගොවිගම රදල වාසගම් ආදේශ කර ගැනීමත්, ගොවිගම දැවැදි සම්ප්‍රදාය අනුගමනය කිරීමත්, තම කුලයට වඩා ඉහළ ගොවිගම සහ වෙනත් කුලවලින් විවාහයන් සිදු කර ගැනීමත්, අනෙක් කුලවල උදවිය මෙන් නගරාසන්න ඉඩම් මිලදීගෙන ඒවායෙහි පදිංචි වීමත් සාකච්ඡා කරනු ලැබ තිබෙයි. ආර්ථික අනුවර්තන උපක්‍රම යටතේ තමන්ගේ ගුරුකම් කටයුතු වයිබර්, වට්සැප්, ඉමෝ වැනි නූතන නව මාධ්‍ය හරහා වාණිජකරණයට ලක්කිරීම පිළිබඳව ඉදිරිපත් කර තිබෙන අතර දේශපාලනික අනුවර්තනයන් යටතේ සමකාලීන රොඩී කුලිකයන්ගෙන් ඇතැමෙක් මැතිවරණ ක්‍රියාදාමයට ඉදිරිපත් වීම සාකච්ඡා කර තිබෙයි. ප්‍රදේශයේ ප්‍රභූ පාසල්වලට තම දරුවන්ට ප්‍රවේශය සකස්කර දීමත් තමන්ගේ පෙර පරම්පරාවලට ප්‍රවිෂ්ට වීමට අවසර නොලැබුණු සතර දේවාල පෙරහරවල්වලින් පත්තිනි දේවාල පෙරහරෙහි නර්තන කටයුතුවලට සහභාගීවීමත් ගොවිගම කුලිකයන් මෙන් වෙසක්, පොසොන්, කඨින වැනි උත්සව සැමරීමත් දන්සල් දීමත් යනාදිය පිළිවෙළින් අධ්‍යාපනික, සංස්කෘතික සහ ආගමික අනුවර්තන උපක්‍රම යටතේ සාකච්ඡා කොට තිබේ. එකී සොයාගැනීම් මත පදනම්ව සමකාලීන රොඩී කුලිකයන් 'ගොවිගමකරණය' (govigamization) ක්‍රියාවලියට ලක් ව සිටින බව පර්යේෂකයා විසින් න්‍යාය ගන්වන ලදි.

**මුඛ්‍ය පද :** සමකාලීන රොඩී කුලිකයා, සමාජ වෙනස්වීම, සමාජ මූලප්‍රවාහකරණය, අනුවර්තන උපක්‍රම, ගොවිගමකරණය

---

[1]ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය. lilanthakperera97@gmail.com